# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1992/28 - 2016 නොවැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2016.11.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

රේගු ආඥා පනතේ (235 වන අධිකාරය) 101 වන වගන්තිය යටතේ වන රෙගුලාසි

**රේගු වටිනාකම සඳහා ප්‍රවාහන පිරිවැය නිර්නය කිරීම**

රේගු ආඥා පනතේ (235 වන අධිකාරය) 101 (1) (එච්) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, මෙසේ කිරීමට අවශ්‍ය හා යෝග්‍ය බවට සෑහීමට පත්වී, පහත සඳහන් වර්ගවල නැව් මගින් භාණ්ඩ ප්‍රවාහනය කළ විට රේගු වටිනාකම සඳහා ප්‍රවාහන පිරිවැය නිර්නය කිරීම 2016 නොවැම්බර් මස 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් නියම කරනු ලැබේ.

(අ) ආනයනකරුවකු තමන්ට අයිති භාණ්ඩ තමන්ටම අයත් නැවක් මගින් ශ්‍රී ලංකාවේ කිසියම් වරායකට ප්‍රවාහනය කළවිට හෝ ආනයනකරුවකු කුලී පදනම මත ගත් නැවක් මගින් එක භාණ්ඩයක් තොග වශයෙන් ශ්‍රී ලංකාවේ කිසියම් වරායකට ප්‍රවාහනය කළවිට, එම භාණ්ඩ සඳහා වූ රේගු වටිනාකම නිර්නය කිරීම සඳහා රේගු ආඥා පනතේ (235 වන අධිකාරය) 'ඉ' උපලේඛනයේ 8 (1) (ඉ) (i) වගන්තිය යටතේ  දක්වා ඇති පරිදි ප්‍රවාහනය කිරීමේ පිරිවැය ලෙස එම භාණ්ඩ වල නැව තෙක් වියදම් සංචිතය (නැවිස) (FOB) මිළෙන් 15% ක් ගත යුතු ය.

(ආ) කෙසේ වුවද, භාණ්ඩ සඳහා වූ ප්‍රවාහනය කිරීමේ පිරිවැය නැව තෙක් වියදම් සංචිතය (නැවිස) (FOB) මිළෙන් 15% අඩුවන්නේ නම්, එකී ප්‍රවාහනය කිරීමේ පිරිවැය රේගු වටිනාකම නිර්නය කිරීම සඳහා සැලකිය යුතු ය.

රේගු ආඥා පනතේ (235 වන අධිකාරය) 101 (1) (එච්) වගන්තිය යටතේ 2012 මැයි මස 04 දින පළ කරන ලද අංක 1756/29 දරන ගැසට් නිවේදනය 2016 නොවැම්බර් මස 11 වැනි දින සිට මෙයින් අවලංගු කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

12 - 691

1A - PG 3262 — 157 (2016/12)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.